සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

07 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය : පැය දෙකයි

නම / විභාග අංකය :

## I - කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඥාතීන් සමූහයකින් යුක්ත, පරම්පරා තුනක් හෝ ඊට වැඩි ගණනක සාමාජිකයන්ගෙන් සමන්විත පවුල වන්නේ,

1. ඒකීය පවුල
2. න්‍යෂ්ටික පවුල
3. විස්තෘත පවුල
4. ප්‍රාථමික පවුල

(02) පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංගයක් නොවන්නේ,

1. සුහදශීලී බව
2. ස්වාධීනව කටයුතු කිරීම
3. අන්‍ය මතවලට ගරු කිරීම
4. ස්වයං විනය

(03) පූර්වාචාර්යවරු ලෙස හඳුන්වන්නේ,

1. දෙමව්පියන් ය
2. පාසල් ගුරුවරුන් ය
3. පූර්ව ළමාවිය සංවර්ධන ගුරුවරුන් ය
4. ආගමික නායකයන් ය

(04) දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකමකි,

1. අධ්‍යාපනය ලබා දීම
2. ලෙඩ රෝගවලින් ආරක්ෂා කිරීම
3. අනෙකුත් අවශ්‍යතා සඳහා සහාය වීම
4. අවනත වීම

(05) කිසියම් විෂය ක්ෂේත්‍රයක් හා සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර,

1. පුවත්පත වේ
2. දත්ත වේ
3. ප්‍රවෘත්ති වේ
4. සමාජ ජාලා වේ

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(විභාග හොඳින් සමත් වීම / සමබර පෞරුෂය / ශ්‍රමය / සුවිශේෂී / ශක්තිමත් වීම)

(06) පවුලේ ආර්ථික කටයුතු සඳහා ........................................................ ලබා ගැනීමේ පහසුව විස්තෘත පවුල් ඒකකයේ විශේෂත්වයකි.

(07) පවුල් ඒකක ........................................................ යහගුණයෙන් පිරි ස්ථාවර ජන සමාජයක පැවැත්මට ඉවහල් වේ.

(08) විවේක කාලය අර්ථවත් ලෙස ගත කිරීම .................................................................. ට හේතු වේ.

(09) DNA පරීක්ෂාව මගින් පුද්ගලයෙකුගේ .................................................................. බව හඳුනාගත හැකිය.

(10) ගුරුවරුන් විසින් දරුවන්ගේ .................................................................. ගොඩ නගයි.

- **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(11) සමාජයක සාර්ථකත්වයට අන්තර් සම්බන්ධතා වැදගත් වේ. (..........)

(12) දත්ත හා තොරතුරු යනු ලිඛිත දේ පමණි. (..........)

(13) 1919 යනු රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය යි. (..........)

(14) අයිතිවාසිකම් දිනාගැනීමෙන් පසු යුතුකම් ඉටුකළ යුතුය. (..........)

(15) සමාජය මගින් ළමයින් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ගයක් ලෙස වෘත්තීය පාඨමාලා හැඳින්විය හැකිය. (..........)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල (අ) කොටසට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය (අ) කොටස ඉදිරියෙන් ඇති වරහන තුළ ලියා දක්වන්න.**

| (අ) කොටස | | (ආ) කොටස |
|---|---|---|
| (16) සිරිත් මල්දමින් දරුවන් තුළ වර්ධනය කරගත හැකි වේ, | (..........) | A) වගකීම |
| (17) සමාජයේ යහපතට හේතුවන ආයතනයකි, | (..........) | B) යහපත් ගතිගුණ |
| (18) චිත්තවේග සංයමයෙන් යුතුව ප්‍රකාශ කිරීමේ හැකියාව වර්ධනයට උපකාරී වේ, | (..........) | C) අමද්‍යප ව්‍යාපාර |
| (19) පවුලේ සාමාජිකයන් එක්ව ආහාර ගැනීම, | (..........) | D) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් |
| (20) යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම වේ, | (..........) | E) සම්ප්‍රදායකි |

(ලකුණු 2 x 20 = 40)



CamScanner

## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරාගනු ලබන අනෙක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.)**

---

(01) 1. න්‍යෂ්ටික පවුල යන්න හඳුන්වන්න.

2. පුද්ගලයෙකු තුළ දක්නට ලැබෙන දුර්වල ගතිලක්ෂණ දෙකක් ලියන්න.
3. ඇසුරුම් සහිත නිෂ්පාදනවල මුද්‍රණය කර ඇති තොරතුරු අතුරින් දෙකක් සඳහන් කරන්න.
4. ඥාතීත්වය හැඳින්වීම සඳහා ප්‍රාදේශීය වශයෙන් වෙනස් ඇමතුම් පද භාවිත වේ. පහත වචන සඳහා භාවිත වන එවැනි පද ලියන්න.
   i. පුංචි අම්මා
   ii. ලොකු තාත්තා
5. කෘෂිකාර්මික කටයුතුවල දියුණුවත් සමග ජන සමාජයේ සංකීර්ණ වූ අවශ්‍යතා දෙකක් ලියා දක්වන්න.
6. ජනතාවගේ යහපත වෙනුවෙන් ජනතාවට සේවය සපයන ආයතන දෙකක් නම් කරන්න.
7. පාසලේ දී ඔබ මුහුණ දුන් අභියෝග අවස්ථාවක් ලියා දක්වන්න.
8. ඉහත අභියෝග අවස්ථාවට සාර්ථකව මුහුණ දීම සඳහා ඔබ ක්‍රියා කළ ආකාරය කුමක් ද?
9. සමාජය මගින් වයෝවෘද්ධ පුද්ගලයන් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.
10. අපට දත්ත හා තොරතුරු ලැබෙන ක්‍රම දෙකක් ලියා දක්වන්න. (ල. 2 x 10 = 20)

(02) 1. පුද්ගලයාගෙන් පුද්ගලයාට සුවිශේෂී ලෙස වෙනස්වන ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

2. පවුලේ සාමාජිකයෙකු ලෙස ජීවත්වීම නිසා ඉන් ඔබට අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)
3. ඔබේ ජීවිතයේ සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග තුනක් දක්වා ඉන් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(03) 1. අභියෝග යනු මොනවා ද? (ල. 02)

2. චිත්තවේග යන්න හඳුන්වා උදාහරණ දෙකක් ලියා දක්වන්න. (ල. 03)
3. අයහපත් චිත්තවේග පාලනයට අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් පහක් ලියා දක්වන්න. (ල. 05)



CamScanner

(04) 1. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (ල. 02)

| පියාගේ පාර්ශවයේ ඥාතීන් | ඔබට ඇති ඥාතීත්වය | මවගේ පාර්ශවයේ ඥාතීන් | ඔබට ඇති ඥාතීත්වය |
|---|---|---|---|
| ඔබේ පියාගේ අයියා | 1. ............................ | ඔබේ මවගේ මල්ලී | මාමා |
| ඔබේ පියාගේ මල්ලීගේ බිරිඳ | 2. ............................ | ඔබේ මවගේ අක්කාගේ සැමියා | ලොකු තාත්තා |
| 3. ............................ | නැන්දා | 4. ............................ | මස්සිනා |

2. පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් තුනක් ලියන්න. (ල. 03)

3. පවුල තුළ පවතින සම්ප්‍රදායන් සඳහා නිදසුන් පහක් ලියන්න. (ල. 05)

(05) 1. දෛනිකව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු දෙකක් ලියන්න. (ල. 02)

2. අයිතිවාසිකම්වල ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

3. තමන්ට හිමි සිවිල් අයිතිවාසිකම් පහක් සඳහන් කරන්න. (ල. 05)

(06) 1. මිනිසා විසින් ප්‍රගුණ කර ගත යුතු උතුම් ගුණාංග දෙකක් ලියා දක්වන්න. (ල. 02)

2. සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් ඇතිවිය හැකි අවාසි තුනක් සඳහන් කරන්න. (ල. 03)

3. ළමා ශ්‍රමිකයින් සේවයේ යෙදවීමෙන් ඇතිවිය හැකි බලපෑම් පහක් සඳහන් කරන්න. (ල. 05)

(07) 1. යුතුකම් යනු මොනවා ද? (ල. 02)

2. තමා විසින් ඉටුකළ යුතු නීතිමය යුතුකම් තුනක් නම් කරන්න. (ල. 03)

3. යුතුකම් හා වගකීම් ඉටු කිරීම සමාජ යහපතට හේතුවන ආකාරය සුදුසු නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)



CamScanner

# දෙවන වාර පරීක්ෂණය

**07 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **විසඳුම් පත්‍රය**

## I - කොටස

01. 3
02. 2
03. 1
04. 4
05. 2
06. ශ්‍රමය
07. ශක්තිමත් වීම
08. විභාගය හොඳින් සමත් වීම
09. සුවිශේෂී
10. සමබර පෞරුෂය
11. ✓
12. x
13. ✓
14. x
15. x
16. B
17. C
18. D
19. E
20. A

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

(01) 1. මව, පියා, දරුවන් පමණක් එකට ජීවත් වන පවුල් න්‍යෂ්ටික පවුල් ලෙස හැඳින්වේ.

2. ක්ෂණික කෝපය, නිවැරදි තීරණ ගැනීමට අපොහොසත් වීම, අන් මත ප්‍රතික්ෂේප කිරීම, අන්‍යයන්ට සවන් නොදීම, නොඉවසිලිමත් බව, තම මතය පමණක් සෑම විටම ක්‍රියාත්මක කිරීමට උත්සාහ දැරීම

3. නිෂ්පාදිත දිනය, කල් ඉකුත්වන දිනය, උපරිම සිල්ලර මිල, ශුද්ධ බර, අඩංගු ද්‍රව්‍ය

4. පුංචි අම්මා - පොඩි අම්මා, බාලම්මා, කුඩම්මා
ලොකු තාත්තා- මහප්පා, ලොකු අප්පච්චි

5. බිම් සැකසීම, වගා කිරීම, අස්වනු නෙලීම, භාණ්ඩ හුවමාරුව, වෙනත් සේවා කටයුතු

6. ආගමික සංවිධාන, මරණාධාර සමිති, යෞවන සමාජ, ක්‍රීඩා සමිති, ග්‍රාම සංවර්ධන සමිති, මහිලා සමිති, වෘත්තීය සමිති

7. විභාගවලට මුහුණ දීම, ශිෂ්‍ය නායක සම්මුඛ පරීක්ෂණ, ක්‍රීඩා තරඟ ආදී ගැළපෙන පිළිතුරු සඳහා

8. අදාළ පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

9. විශ්‍රාම වැටුප්, සුභ සාධක අරමුදල්, සෞඛ්‍ය ආරක්ෂණය

10. රූපවාහිනිය, ගුවන් විදුලිය, අන්තර්ජාලය, පුවත්පත්, රැස්වීම්, ශබ්ද විකාශන යන්ත්‍ර

(මුළු ල. 2 x 10 = 20)

(02) 1. බාහිර පෙනුම, අත්ලේ රේඛා සටහන්, ඇඟිලි සලකුණු (ල. 02)

2. අධ්‍යාපනය ලැබීම, ආරක්ෂාව ලැබීම, නායකත්ව ගුණාංග වර්ධනය වීම, ආහාර හා පෝෂණය ලැබීම, පාරම්පරික දැනුම ලැබීම, යහපත් පූර්වාදර්ශ ලැබීම, නායකත්වයට ගරු කිරීමට හුරුවීම (ල. 03)

3. පවුල, පාසල, ආගමික ස්ථාන, කල්‍යාණ මිත්‍රයන්, හොඳ පොත්පත්, හොඳ මාධ්‍ය වැඩසටහන් (ල. 03)
ඉන් එකක් පැහැදිලි කිරීමට (ල. 02)

(මුළු ල. 10)

(03) 1. සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා ජීවන අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාත්මක වීමේදී විවිධ බාධක හා සීමාවලට මුහුණ දීමට සිදු වේ. ඒවා අභියෝග ලෙස හඳුන්වයි. (ල. 02)

2. පුද්ගලයා මුහුණපාන විවිධ අවස්ථාවන්ට සම්බන්ධව සිත තුළ ජනිත වන සිතුවිලි, හැඟීම් චිත්තවේග ලෙස හැඳින්විය හැකිය. (ල. 02)
චිත්තවේග සඳහා නිදසුන් - සතුට, දුක, දයාව, කරුණාව, බිය, කෝපය (ල. 01)

3. ආගමික කටයුතුවල යෙදීම, ඇවිදීම, කවි ගීත ගායනය, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්යාත්මක ක්‍රියා, පොත්පත් කියවීම, අවට පරිසරයේ සෞන්දර්ය නැරඹීම, ගුවන් විදුලියට සවන් දීම, හරවත් රූපවාහිනී වැඩසටහන් නැරඹීම, පුවත්පත් කියවීම, ක්‍රීඩාවල නිරත වීම (ල. 05)

(මුළු ල. 10)





CamScanner

(04) 1. 1) මහප්පා 2) පුංචි අම්මා

3) පියාගේ අක්කා / නංගී 4) මවගේ අයියාගේ / මල්ලීගේ, පුතා (ල. 02)

2. ආහාර හා පෝෂණය ලබා දීම, සෞඛ්‍ය පහසුකම් ලබා දීම, ඇඳුම් පැළඳුම් ලබා දීම, නිවාස පහසුකම් ලබා දීම, දෙමාපියන්ගේ ආදරය / දයාව / සෙනෙහස ලැබීම, දෙමාපියන් හා වැඩිහිටියන්ගේ ආරක්ෂාව ලැබීම, අධ්‍යාපනය ලබා දීම (ල. 03)

3. දිනපතා ආගම සිහි කිරීම, නිවසින් බැහැරට යාමේ දී දෙමාපියන් වැඩිහිටියන් නැමද ආශිර්වාද ලබා ගැනීම, පවුලේ සාමාජිකයන් එක්ව ආහාර ගැනීම, අවුරුදු උදාවට පෙර හෝ පසු ඥාතීන් බැලීමට යාම, ආගමික වශයෙන් වැදගත් වන දිනවල පවුලේ සාමාජිකයන් එක් ව ආගමික සිද්ධස්ථානවලට යාම (ල. 05)

(මුළු ල. 10)

(05) 1. කාලගුණ අනාවැකි, විනිමය අනුපාත, වෙළෙඳපොල මිලගණන්, හදිසි හා වැදගත් දුරකථන අංක, වෙළෙඳ දැන්වීම්, ලුහුඬු දැන්වීම්, රාජ්‍ය නිවේදන, රැකියා තොරතුරු (ල. 02)

2. සමාජය තුළින් ම හිමි වේ, සමාජයේ පොදු යහපත සමඟ එකට බැඳේ, අසීමිත නොවී පවතී, ආත්මාර්ථකාමීත්වයෙන් තොර වෙයි, යුතුකම් සමඟ බැඳෙයි (ල. 03)

3. ජීවත්වීමේ අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, කැමති ආගමක් ඇදහීම, අදහස් ප්‍රකාශ කිරීම, රැකියාවක් කිරීම, සමානාත්මතාව, කැමති තැනක ජීවත්වීම (ල. 05)

(මුළු ල. 10)

(06) 1. යුතුකම් ඉටු කිරීම, නීතිගරුක බව, චාම් දිවි පැවැත්ම, අන්මත ඉවසීම, අන් අයට ආදරය කිරීම, දයාව කරුණාව, අවංක බව, සදාචාරාත්මක බව, පරාර්ථකාමී බව, ප්‍රිය වචන භාවිතය, විනයගරුක බව, අයිතිවාසිකම්වලට ගරු කිරීම (ල. 02)

2. ශ්‍රමය සූරාකෑම, සේවක අතෘප්තිය, සාධාරණ වැටුපක් නොලැබීම, වෘත්තීය සුරක්ෂිතතාව නැති වී යාම, විශ්‍රාම ගිය විට අසරණ තත්ත්වයට පත්වීම, සේවක අසාධාරණකම් සිදු වීම, සේවා යෝජකයින්ගේ බලපෑම්වලට ලක් වීම, අනාරක්ෂිතව කටයුතු කිරීමෙන් රෝගී වීම, අනතුරුවලට ලක් වීම (ල. 03)

3. කායික හා මානසික ශක්තිය පිරිහීමෙන් රෝගී වීම, ශ්‍රමය සූරාකෑමට ලක් වීම, අපයෝජනයට ලක්වීම, ඉගෙනීමට ඇති අවස්ථා අහිමිවීම, සුන්දර වූ ළමා කාලය අහිමිවීම, සමාජ විරෝධී ක්‍රියාවලට යොමුවීම, මත්පැන් / මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, වද හිංසාවලට ලක්වීම, ආබාධිත තත්ත්වයන්ට ගොදුරුවීම (ල. 05)

(මුළු ල. 10)

(07) 1. යුතුකම් යනු පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීමයි. (ල. 02)

2. රජයට අවනත වීම, රාජ්‍ය නීති පිළිපැදීම, බදු ගෙවීම, රාජකාරිය නිසි ලෙස ඉටු කිරීම, නීතිය හා සාමය පවත්වා ගෙන යාම (ල. 03)

3. නීති පිළිපැදීම, නීතිවලට ගරු කරන පුරවැසියන් බිහිවීම, වැරදි කිරීමට පුද්ගලයින් නොපෙළඹීම, නීතිගරුක පුරවැසියන් බිහිවීම, තමන්ගේ හා අන්‍යන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම (ල. 05)

(මුළු ල. 10)



CamScanner